**සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම -2017**

**1.** මූල්‍ය ප්‍රකාශන

**1.1** ව්‍යාවනය කළ මතය

**සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගමේ 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ අලාභ හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

**මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.**

**1.2** ව්‍යාවනය කළ මතය සඳහා පදනම

**මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාවනය කරනු ලැබේ.**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ ව්‍යාවනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.**

**සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.**

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.**

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 07 (SLFRS 07) හි 14 වන ඡේදය ප්‍රකාරව ඇප සඳහා තබා ඇති මූල්‍ය උපකරණවල වටිනාකම සහ එම ඇප සඳහා පවතින නියම හා කොන්දේසි මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවත්, සමාගම විසින් ලංසු බැඳුම්කර සහ කාර්යසාධන බැඳුම්කර සඳහා ඇප වශයෙන් තබා ඇති රු.40,394,318 ක් වූ ස්ථාවර තැන්පතු පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2018/19 මූල්‍ය වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වාර්තාකරණ ප්‍රමිති අනුව කටයුතු කළ යුතු බව. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන අනුව සමාගමේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ටැඹ අත්තිවාරම ඉදිකිරීම සඳහා දරා තිබූ පිරිවැය රු.739,461,678 (බදු රහිතව)ක් විය. මෙම ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු 2016 දෙසැම්බර් 31 දින වන විට නතර කර තිබුණි. ගොඩනැගිල්ල ඉදිකිරීම් කර ඇති ඉඩමෙහි අයිතිය සමාලෝචිත වර්ෂයේ අවසාන වන විටත් සමාගම වෙත පවරා නොතිබුණු අතර සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල එම ගොඩනැගිල්ල වත්කම් යටතේ පෙන්නුම් කර නොතිබුණි. | 2020/21 මූල්‍ය වර්ෂයේදී නැවත ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කර ඇති බව. | කඩිනමින් පවරාගැනීමට කටයුතු කළ යුතු බව. |

### 1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| ණයගැති ශේෂ | 26,908,333 | 1,504,142 | 25,404,191 | අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන් අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇති බව. | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම ඊට අනුරූපී වාර්තා අනුව සමාන විය යුතු බව. |

**1.5.3** විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනටවූ නිල ඇඳුම් හා පතරොම් තොග | 34,250,522 | තොග සත්‍යාපන වාර්තා | නව කළමණාකාරීත්වය යටතේ 2020/21 වර්ෂයේදී අවශ්‍ය වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | තොග සත්‍යාපන වාර්තා ඉදිරිපත් කළ යුතු බව. |

**1.6** ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

**1.6.1** ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව 2018 මාර්තු 31 දිනට වූ රු.1,746,485,473 ක වෙළඳ ලැබිය යුතු ශේෂයෙන් සී/ස ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් (පුද්ගලික ) සමාගමෙන් 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ලැබිය යුතු රු.1,428,866,986 ක් වූ ණයගැති ශේෂයට අදාළ ශේෂ සනාථ කිරීම් වර්ෂ 03 ක පමණ සිට විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ශේෂවල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය. | 2021 වර්ෂය තුළදී ශේෂ සනාථන ලිපියක් ලබාගෙන විගණනය වෙත ඉදිරිපත් කිරීමට හැකියාව පවතින බව. | අදාළ ශේෂ සනාථ කිරීම් කැඳවීම (ලබාගැනීම) කළ යුතු බව. |
| (ආ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව 2018 මාර්තු 31 දිනට රු.2,182,942,702 ක් වූ වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂයෙන් , සී/ස ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් (පුද්ගලික) සමාගමෙන් ලැබිය යුතු මුළු ණයගැති ශේෂය රු.1,890,499,614 ක් වූ අතර ශුද්ධ වත්කම් වලින් සියයට 57 ක් නියෝජනය කර තිබුණි. | මේ වන විට උසාවියේදී විභාග වන කරුණක් බැවින් එය සමථයකට පත්කර 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ඇ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව 2018 මාර්තු 31 දිනට රු.523,781,502 ක්වූ වෙනත් ලැබිය යුතු ශේෂයෙන් , ගාල්ල පාවෙන අවිගාර ව්‍යාපෘතිය හා රංගල අවි ගුවනින් ප්‍රවාහනය කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් සී/ස ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් ( පුද්ගලික) සමාගමෙන් 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ලැබිය යුතු රු.461,632,628 ක ශේෂයට අදාළ ශේෂ සනාථ කිරීම්ද වර්ෂ 03 ක පමණ සිට විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ශේෂවල නිරවද්‍යතාවය තහවුරු කරගැනීමට නොහැකි විය. | -එම - | ශේෂවල නිරවද්‍යතාවය කැඳවීමට (ලබාගැනීමට) කටයුතු කළ යුතු බව. |

| | | |
|---|---|---|
| (ඇ) සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව **2018** මාර්තු **31** දිනට සමාගමට අයවිය යුතු ගොඩබිම් ආරක්ෂක අංශයේ සහ සමුද්‍ර ආරක්ෂක අංශයේ වෙළඳ ණයගැති ශේෂයන් පිළිවෙලින් රු.**214,893,768** සහ රු.**1,531,591,705** ක්වූ අතර එම ශේෂ වලින් පිළිවෙලින් රු.**200,314,299** සහ රු.**101,973,313** ක්වූ ණයගැති ශේෂ වෙනුවෙන් ශේෂ සනාථන කැඳවා තිබුණද ශේෂ සනාථන ලැබී තිබුණේ ගොඩබිම් ආරක්ෂක අංශයේ රු.**26,946,884** ක් සහ සමුද්‍ර ආරක්ෂක අංශයේ රු.**361,544** ක් සඳහා පමණි.ඒ අනුව ණයගැති ශේෂවලින් පිළිවෙලින් රු.**173,367,415** සහ රු**101,611,769** ක්වූ ශේෂ සඳහා ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ශේෂවල නිරවද්‍යතාවය තහවුරු කරගැනීමට නොහැකි විය. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන් අනුව **2020/21** වර්ෂයේදී නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව. | ශේෂ සනාථ කිරීම් කැඳවීම කළ යුතු බව. |

## 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව **2018** මාර්තු **31** දිනට රු.**815,299,681** ක්වූ වෙළඳ හා වෙනත් ගෙවියයුතු ශේෂයෙන් සී/ස ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් (පුද්ගලික) සමාගමට **2015** වර්ෂයේ සිට **2018** වර්ෂය දක්වා ගෙවිය යුතු රු.**762,814,313** ක ශේෂයට අදාළ ශේෂ සනාථ කිරීම් ද වර්ෂ **03** ක පමණ සිට විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ශේෂවල නිරවද්‍යතාවය තහවුරු කරගැනීමට නොහැකි විය. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන් අනුව **2020/21** වර්ෂයේදී නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව. | ශේෂවල නිරවද්‍යතාවය තහවුරු කිරීමට කටයුතු කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. **22,259,368** ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. **48,614,305** ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. **26,354,937** ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පරිපාලන වියදම් තුළ ඇතුළත් උපදේශන ගාස්තු ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට **543** කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන විධායක නිලධාරී දීමනා වියදම පිළිවෙලින් රු.**59,800** ක් හා **392,500** ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එම වියදම සියයට **556** කින් වැඩිවී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය සියයට **4.88** කින්ද ණයගැති පිරිවැටුම් අනුපාතය වාර **0.17** කින් අඩුවී තිබුණු අතර ණය අයකරගැනීමේ කාලය දින **318** කින් වැඩිවී තිබුණි. ඒ පිළිබඳව අවධානය යොමුකරමින් සමාගමේ මෙහෙයුම් කටයුතු කාර්යක්ෂම කරගත යුතුය.